# ඇබෑර්තු

## වාරිමාර්ග අමාත්‍යාංශය සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

අමාත්‍යාංශයේ හදිසි හා අත්‍යවශ්‍ය ප්‍රසම්පාදන අවශ්‍යතා හා අමාත්‍යාංශය යටතේ අනෙකුත් ව්‍යාපෘති සඳහා සේවය කිරීමේ අවශ්‍යතාවය මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 01/2019 හා ලෝක බැංකුව අරමුදල් සපයන දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය ව්‍යාපෘතිය සඳහා වන රජයේ බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව පහත සඳහන් තනතුරු සඳහා "කොන්ත්‍රාත් පදනම" මත ව්‍යාපෘති කළමනාකරණ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් උද්යෝගිමත් හා කැපවීමෙන් යුතු ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

එම තනතුර සඳහා වන වැටුප ඉහත සඳහන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 01/2019 දරන චක්‍රලේඛයේ 03 වන වගුවේ 03 වන තීරුවේ සඳහන් කර ඇත.

අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 64 ට අඩු විය යුතුය.

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දක්ෂතාවය හා රජයේ රෙගුලාසි පිළිබඳ හුරුපුරුදු දැනීමක් තිබීම හා පරිගණක සාක්ෂරතාවය පූර්වාවශ්‍යතාවන් වේ. ජාත්‍යන්තර උපදේශන සේවාවන්වල ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ සේවා පළපුරුද්ද, ප්‍රධාන ඉදිකිරීම් සිවිල් කර්මාන්ත හා නවීන උපකරණ හා ශ්‍රී ලංකාවේ විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල භාවිතා වන අතිශයින් සියුම් මෙවලම් පිළිබඳ දැනීම හා පළපුරුද්ද තිබිය යුතුය. අදාළ පළපුරුද්ද ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිවල තිබීම වාසියක් ලෙස සැලකේ.

| අංකය | PS කාණ්ඩය | තනතුර | ඇබෑර්තු ප්‍රමාණය | අදාළ වන චක්‍රලේඛය |
|---|---|---|---|---|
| 01 | PS 3 | ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කළමනාකරණ විශේෂඥ | 01 | MSD චක්‍රලේඛය 1/2019 |

වැඩිදුර තොරතුරු සඳහා www.irrigationmin.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත හැකි අතර, ඉහත සඳහන් චක්‍රලේඛ සඳහා මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවියට පිවිසෙන්න.

අයදුම්පත් 2024 ජනවාරි 18 වෙනි දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතු අතර, අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය,**
**අංක 11, ජාවත්ත පාර, කොළඹ 05.**

කෙටි ලයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. අනිසි බලපෑම් කිරීම නුසුදුස්සෙකු බවට පත්කරන අතර, එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේකම්,**
**වාරිමාර්ග අමාත්‍යාංශය.**
**2024.01.02**